GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2012.07.07

## මාධ්‍ය නිවේදනයයි

## ලංකාව තුල සුදුසුකම් නොලත් විදේශිය වෛද්‍යවරුන් සේවය කිරීම පිළිබඳ ගැටළුව

ලංකාවට පැමිණෙන විදේශ වෛද්‍යවරු වෛද්‍ය ආඥාපනතේ 67A වගන්තිය යටතේ වෛද්‍යවරු ලෙස "තාවකාලික ලියාපදිංචිය ලබා ගනී." ඉන් අනතුරුව ඔවුන් විශේෂඥ වෛද්‍යවරු ලෙස ලංකාවේ සේවය කරයි.

67A වගන්තිය යටතේ ලියාපදිංචිය ලබාදීමේදී ඔවුන්ගේ සුදුසුකම් පරික්ෂා කිරීමේ පිලිගත් ක්‍රමවේදයක් මේ වන තෙක් නොතිබුණි. එබැවින් සුදුසුකම් නොමැතිව මොවුන් රෝගී ප්‍රතිකාර සිදු කරණ බව අපට දැනගන්නට ලැබී ඇත.

මේ පිළිබඳ අප සෞඛ්‍ය ලේකම් තුමාට දැනුම් දුන් අතර ඒ අනුව වෛද්‍ය සුදුසුකම් පරික්ෂා කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීමට තීරණය විය. ඒ අනුව පිලිගත් ක්‍රමවේදයක් මේ වන විට එළි දක්වා ඇත.

එම ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම මඟින් සුදුසුකම් නොමැතිව සේවය කළ විදේශ වෛද්‍යවරුන් කිහිප දෙනෙකුගේ සේවය අත්හිටුවීමට අදාල බලධාරින් කටයුතු කර ඇත.

සුදුසුකම් නොමැති බවට තහවුරු වූ විදේශ වෛද්‍යවරු අදාල අනුමැතිය කෙසේ හෝ ලබා ගැනීමට බලධාරින්ට බලපෑම් සිදු කරමින් සිටී.

මේ පිළිබඳව අප සංගමය දැඩි විමසිල්ලෙන් සිටින අතර එසේ බලපෑම් කිරීම දැඩි අප්‍රසාදයෙන් හෙලා දකිමු.

**රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය**

වැඩිදුර විස්තර :

වෛද්‍ය නවීන් සොයිසා : 0718582444
වෛද්‍ය නලින් ආරියරත්න : 0714800942